(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 227.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1895/'11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය වසා දමා වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;

(ii) මෙම විද්‍යාලය සතුව පැවති ගොඩනැගිලි කිහිපයක් මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(iii) එම විද්‍යාලය සතුව අක්කර හතක පමණ භූමි ප්‍රමාණයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය සතු ගොඩනැගිලි සහ භූමිභාගය විනාශයට පත්වීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

(ii) එම විද්‍යාලය සතු සම්පත් යොදා ගනිමින් කර්මාන්තශාලාවක් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සැපයිය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් මතු යෝජිත පරිදි යොදා ගැනීමට සැලසුම් කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1986/'11

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2207/'11

3.

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යොදවන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(iii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එක් එක් සේවකයාට අදාළව ලාභය හෝ අලාභය කොපමණද;

(v) බදු හෝ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ රාජ්‍ය ආයතන විසින් රූපවාහිනී සංස්ථාවට ගෙවිය යුතුව තිබූ මුදල් ප්‍රමාණය, එම ආයතනවල නම් සහ ඒවා විසින් ගෙවිය යුතුව තිබූ මුදල් ප්‍රමාණයන්ද සමගින් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2327/'12

4.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2011 දක්වා කාල සීමාව තුළ රු. 900 හා රු. 1500 ලෙස සහනාධාර ලැබූ සමෘද්ධිලාභීන්ගෙන් සමෘද්ධි බැංකු හරහා වාර්ෂිකව අයකර ගෙන ඇති අනිවාර්ය ඉතිරිකිරීම් මුදල් ප්‍රමාණයන්;

(ii) අනිවාර්ය ඉතිරිකිරීම් අයකර ගත් එම සමෘද්ධිලාභීන් අතරින් මේ වන විට සමෘද්ධි දීමනාව කපා හැර ඇති සංඛ්‍යාව;

(iii) එසේ සමෘද්ධිය කපා හැරි සමෘද්ධිලාභීන් අතරින් මේ වන විට අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ලබාගෙන ඇති සංඛ්‍යාව;

(iv) එසේ ගෙවන ලද මුළු මුදල;

(v) මේ වනවිට සමෘද්ධිය අහිමිකළ සමෘද්ධිලාභීන් අතරින් අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ගෙවීමට ඇති පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි වැඩසටහනින් ඉවත්වූ සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ගෙවා අවසන් කිරීමට ගතවන කාලය කොපමණද;

(ii) දැනට මියගොස් ඇති සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ගෙවීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2543/'12

5.

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධාවනය වන දුම්රියවලට දුම්රිය මැදිරි අමුණාගෙන යාමට පෞද්ගලික සමාගම්වලට අවසර ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම සමාගම් තෝරාගනු ලැබූ පදනම කවරේද;

(iv) එම එක් එක් සමාගමට අමුණාගෙන යෑම සඳහා අවසර ලබාදී ඇති දුම්රිය මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික සමාගම් සතු දුම්රිය මැදිරියකින් කොළඹ සිට මහනුවර දක්වා ගමන් කිරීමට අයකරනු ලබන ගාස්තුව එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අයකරනු ලබන එම මුදලින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන මුදල කොපමණද;

(iii) පෞද්ගලික සමාගම් විසින් අමුණා ධාවනය කරනු ලබන දුම්රිය මැදිරි එම සමාගම් විසින්ම ආනයනය කරනු ලැබූ ඒවාද;

(iv) නොඑසේ නම්, ඒවායේ පෙර අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබුනේද;

(v) එසේ නම්, පෞද්ගලික සමාගම් වෙත එම මැදිරි පැවරීම ටෙන්ඩර් කැඳවීමකින් පසුව සිදු කළේද;

(vi) එසේ නම්, එම මැදිරි ලබා දුන් මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2696/'12

6.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේ සිට මේ දක්වා වාද්දුව, තල්පිටිය මාදැල් වරාය තුළ අබලන් වූ බත්තලක් නවතා ඇති බවත්;

(ii) එම බත්තල හේතුකොට ගෙන තල්පිටිය මාදැල් වරායේ ධීවර කටයුතුවලට බාධා පැමිණෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් බත්තලෙහි හිමිකරු කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම බත්තල තල්පිටිය මාදැල් වරායෙන් ඉවත් කොට එම වරායේ ධීවර කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2949/'12

7\.
ගරු ඒ. විනායගමූර්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතෙහි රෝහල්වල ප්‍රතිකාර ලබාගන්නා මානසික බලපෑම්වලට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී මානසික බලපෑම්වලට ලක්වූ පුද්ගලයන් ආබාධිත පුද්ගලයන් ලෙස සැලකිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උතුරු පළාතේ ඉහත කී මානසික බලපෑම්වලට ලක්වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමට යම් වැඩසටහන් තිබේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2951/'12

8\.
ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) ආරම්භක දිනයේ සිට මේ දක්වා එම අරමුදලේ සාමාජික සංඛ්‍යාව සහ ඊට ලැබුණු මුදල, සමෘද්ධි සහනාධාර නිකුත් කළ කාර්තු අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2012 ජූනි 30 දිනට එම අරමුදලේ ශේෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම අරමුදලෙහි,

(i) මුදල් භාවිතා කළ හැකි කාර්යයන්;

(ii) ආරම්භයේ සිට මේ දක්වා එහි මුදල් භාවිතා කර ඇති කාර්යයන්;

(iii) නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි;

(iv) සාමාජිකයෙකුගේ සමාජ ආරක්ෂණ හිමිකමක් සඳහා වන ඉල්ලීමකට අදාළ ගෙවීම සිදුකිරීමට ගතවන කාලය;

(v) සමාජිකයකුට හිමි ගෙවීම සිදුකිරීමේදී නියමිත කාලය ඉක්මවා යන්නේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල භාවිත කර වෙනත් ආයෝජන සිදුකර තිබේද;

(ii) එසේ නම්, ආරම්භයේ සිට මේ දක්වා සිදුකළ ආයෝජනයන්ගෙන් උපයාගෙන ඇති ලාභය කොපමණද;

(iii) එම ලාභ බෙදීයන පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් පාර්ශ්වයන් වෙත බෙදීයන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2993/'12

9\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය කොස්තාපල් රියදුරන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් දැනට රාජකාරී කරන සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින පොලිස් කොස්තාපල් රියදුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිස් කොස්තාපල් රියදුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් පොලිස් ස්ථානවල විශාල වශයෙන් ගැටලු මතුවී තිබෙන බව දන්නේද;

(ii) මේ වන විට එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) පොලිස් කොස්තාපල් රියදුරන් බඳවා ගන්නා වයස් කාණ්ඩය කවරේද;

(iv) එම බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොලිස් දෙපාර්තමේන්තුවේ කොස්තාපල් රියදුරු පුරප්පාඩුවලට අමතරව වෙනත් තනතුරුවල පුරප්පාඩු තිබේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු තනතුරු කවරේද;

(iii) එම එක් එක් තනතුරෙහි පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1897/'11

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උඩවැලිපිටිතලාව හන්දියේ සිට හොරන්ගල්ල දක්වා මාර්ගයේ අතුරන ලද කොන්ක්‍රීට් මේ වන විට කැඩී ගොස්, පාරේ වලවල් හැරී ඇති බවත්;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම නිසි ප්‍රමිතියකින් තොරව සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොන්ක්‍රීට් අතුරන ලද ඉහත මාර්ගයේ දිග සහ පළල කොපමණද;

(ii) කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වැයකරන ලද මුළු මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සිදු කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iii) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) කොන්ත්‍රාත්කරු මගින් හෝ වෙනත් ප්‍රතිපාදනයක් මගින් එම මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2160/'11

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවය කරන ස්ථාන කවරේද;

(iii) ඔවුන් අතරින් වනාන්තර කලාප සඳහා අනුයුක්ත කොට ඇති පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට ලබා දී ඇති පහසුකම් කවරේද;

(v) වනජීවී කලාප සඳහා හිඟ හෝ අතිරික්ත පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) පශු වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පවතින්නේ නම්, එම පුරප්පාඩු සම්පූර්ණ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2208/'11

12.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව, එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කවරේද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/'12

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොලිස් නිලධාරීන් සමග සමාන රාජකාරියේ යෙදෙන පොලිස් ආරක්ෂක සහායකයින්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ ස්ථිර කර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිස් ආරක්ෂක සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබුවේද;

(ii) ඔවුන්ට නිසි නිල ඇඳුමක් සහ රාජකාරියේ යෙදෙන අවස්ථාවල තොරතුරු සටහන් පොතේ රාජකාරි වාර්තා කිරීමේ අවසරය ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක, කලාප දීමනා, ගමන් වියදම්, දුෂ්කර දීමනා, බටා දීමනා සේවය ස්ථිර කළ දින සිටම පොලිස් ආරක්ෂක සහායකයන්ට ගෙවා තිබේද;

(iv) එසේ ගෙවා නොමැති නම්, එම වරප්‍රසාද ඔවුන්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2545/'12

14.

ගරු අනුර දිසානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගාල්ල සිට කොළඹ දක්වා කොටසේ මගී ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දී ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා දී ඇති පදනම කවරේද;

(iii) එක් බලපත්‍රයක් ලබාගැනීමට වාර්ෂිකව ගෙවිය යුතු මුදල කොපමණද;

(iv) එම බස් ධාවනය සඳහා සකස්කර ඇති ධාවන කාලසටහන කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'මැනින් ටවුම' නිවාස යෝජනා ක්‍රමයේ ඇතැම් නිවැසියන් විසින් ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරට පටහැනිව අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බවත්;

(ii) එම නිවාස යෝජනා ක්‍රමයේ කළමනාකරණ සංස්ථාව විසින් එකී අනවසර ඉදිකිරීම් වාර්තා කිරීම හෝ ඉවත් කිරීම ඕනෑකමින්ම මග හැර ඇති බවත්;

(iii) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සිය බලතල අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා පරීක්ෂා නොකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 'මැනින්ටවුම' නිවාස යෝජනා ක්‍රමයේ මේ වන විට ඇති අනවසර ඉදිකිරීම් වහාම ඉවත් කරන ලෙස සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට උපදෙස් දීමටත්;

(ii) එම අධිකාරියේ නිරන්තර පරීක්ෂා කිරීම් තුළින් ඉහත නිවාස සංකීර්ණයේ සහාධිපත්‍ය දේපළ, පොදු අංගෝපාංග සහ පොදු දේපළවල පාලනය යථාපරිදි පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය නියෝග ලබා දීමටත්;

(iii) බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ විධිවිධානවලට අනුකූලව හා යටත්ව කටයුතු කළයුතු බවට සියලු කළමනාකරණ සංස්ථාවලට පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2013) — (හයවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2012 නොවැම්බර් 08) [1]

*2.

දිවි නැගුම පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2012 නොවැම්බර් මස 06) [1]

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්. ඒ. එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 වැනි දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු.48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්ති යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදී.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.02.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.04.05 දින සලකා බලන ලදී.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2009.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදී.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2010,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2012.06.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදී.)

*12.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

16.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

පා.167/'12

19.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු විජය දහනායක මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු අචල ජාගොඩගේ මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු ජයරත්න හේරත් මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු හුනෙයිස් ෆාරුක් මහතා

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු පියංකර ජයරත්න මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු රුවන් රණතුංග මහතා

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා

ගරු පී. දයාරත්න මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු අර්ල් ගුණසේකර මහතා

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු පී. පියසේන මහතා

ගරු ගුණරත්න වීරකෝන් මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු ප්‍රභා ගනේසන් මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජීවන් කුමාරණතුංග මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු නවීන් දිසානායක මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු බෂීර් සේගු ඩාවුඩ් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධූරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව,—

1. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් සමාගම් වන සෙලින්කෝ ශ්‍රී රාම් කැපිටල් මැනේජ්මන්ට්, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි සහ ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පැනි  ලිමිටඩ් යන සමාගම්වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක පිළිවෙළින් 262/2009, 191/2009 සහ 317/2009 දරන නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරු මඬුල්ලක් විසින් විභාග කරමින් තිබියදී, එකී නඩු එම විනිසුරු මඬුල්ලෙන් ඉවත්කර, තම අධිකරණයේ වැඩිදුර විභාගය සඳහා ගෙන එම නඩු විභාග කිරීමේ විනිසුරු මඬුල්ලේ සභාපති විනිසුරු ලෙස කටයුතු කරමින් එම නඩුවල විෂයය වස්තුවක් වන්නා වූ සෙලින්කෝ නිවාස සහ දේපල සමාගම නමින් හැඳින් වූ, සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් සහ සෙලින්කෝ කොන්ඩොමීනියම් ලිමිටඩ් නමින් හැඳින්වූ වර්තමානයේ ට්‍රිලියම් රෙසිඩන්සීස් නමින් හඳුන්වනු ලබන ආයතනයට අයත්, කොළඹ 08, ඇල්විටිගල මාවතේ, අංක 153 දරන ස්ථානයේ පිහිටි, ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක 262/2009 දරන නඩුවේ දේපල ලැයිස්තුවේ සඳහන් නිවාස ව්‍යාපෘතියෙන් අංක 2සී/එෆ්2/පී4 සහ වරිපනම් අංක 153/1-2/4 දරන නිවස, ඕස්ට්‍රේලියාවේ, බටහිර ඕස්ට්‍රේලියා 6016හි, මවුන්ට් හෝතෝර්න් හි, එජිනා වීදියේ, අංක 127 දරන ස්ථානයේ පදිංචි රේණුකා නිරංජලි බණ්ඩාරනායක සහ කපිල රන්ජන් කරුණාරත්න යන දෙදෙනා විසින් ලබාදෙන ලද ප්‍රසිද්ධ නොතාරිස් කේ. බී. අරෝෂි පෙරේරාගේ අංක 823 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය උපයෝගී කරගෙන රේණුකා නිරංජලි බණ්ඩාරනායක සහ කපිල රන්ජන් කරුණාරත්න යන දෙදෙනාගේ නමට මිල දී ගැනීමෙන් ද;

2. ඉහත කී දේපළ මිල දී ගැනීම සඳහා ගෙවීම් කිරීමේ දී උපයා ගත් ආකාරය හෙළි කළ නොහැකි රුපියල් 19,362,500ක මුදලක් එම දේපළ මිල දී ගැනීමට පෙර එම දේපළ විකුණන ලද සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් සහ ට්‍රිලියම් රෙසිඩන්සීස් සමාගමට මුදලින් ගෙවීමෙන් ද;

3. එන්ඩීබී බැංකුවේ, කොළඹ 07, ධර්මපාල මාවතේ පිහිටි ශාඛාවේ 106450013024, 101000046737, 100002001360 සහ 100001014772 යන ගිණුම්වලට 2011 අප්‍රේල් 18 සිට 2012 මාර්තු 27 දින දක්වා කාලය තුළ රුපියල් මිලියන 34ක පමණ විදේශීය මුදල් තැන්පත් කිරීමෙන් පසු එම තොරතුරු අධිකරණ නිලධාරියෙකු විසින් ලබා දිය යුතු වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ සඳහන් නොකිරීමෙන් ද;

4. ඉහත කී එන්ඩීබී බැංකු ශාඛාවේ ගිණුම් අංක 106450013024, 101000046737, 100002001360, 100001014772, 100002001967, 100101001275, 100110000338, 100121001797 සහ 100124000238 දරන ගිණුම් නවයක් ඇතුළුව  විවිධ බැංකුවල බැංකු ගිණුම් විස්සකට අධික සංඛ්‍යාවක් පවත්වාගෙන යමින්, එකී තොරතුරු අධිකරණ නිලධාරියෙකු විසින් ලබාදිය යුතු වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ සඳහන් නොකිරීමෙන් ද;

5. දැනට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවතින වර්ෂ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභා පනත යටතේ අල්ලස් සහ/හෝ දූෂණ ක්‍රියාවලට අදාළ වරදවල් සම්බන්ධයෙන් නීති කෘත්‍යයන්වලට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන ප්‍රදීප් ගාමිණී සුරාජ් කාරියවසම් මහතා සැකකරුවෙකු වන හෙයින් ද;

ඉහත කී අල්ලස් හෝ දූෂණ නඩුව විභාගවීමට නියමිත වූ එකී අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා මාරු කිරීම, විනය පාලනය සහ ඉවත් කිරීමේ බලතල පැවරී ඇති අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ධූරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව අනුව එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් දරන හෙයින් ද;

එකී අධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන අධිකරණ වාර්තා, රෙජිස්ටර් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ බලතල අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරිය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ(3) ව්‍යවස්ථාව යටතේ එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය වෙත පැවරී ඇති හෙයින් ද;

ඉහත කී ආකාරයට ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන ප්‍රදීප් ගාමිණී සුරාජ් කාරියවසම් මහතාට එරෙහිව ඉදිරිපත් කර ඇති අල්ලස් හෝ දූෂණ චෝදනාවලට අදාළ නීති කෘත්‍යය හේතුවෙන් අග්‍ර විනිශ්චයකාර ධූරයේ තව දුරටත් ක්‍රියා කිරීමට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය නුසුදුස්සෙකු වන හෙයින් ද, අග්‍ර විනිශ්චයකාර ධූරයේ ඇය අඛණ්ඩව ක්‍රියා කිරීම හේතුවෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉෂ්ට කිරීම සඳහා බාධාවක් වීම සහ යුක්තිය පසිඳලීම පිළිබඳ මූලික සිද්ධාන්ත එමගින් උල්ලංඝනය වන බැවින් සහ යුක්තිය ඉටුවීම පමණක් නොව යුක්තිය ඉටුවන බවට දෘශ්‍යමාන විය යුතු හෙයින්ද;

6. මුල් අවස්ථා අධිකරණවල ජ්‍යෙෂ්ඨ නිලධරයන් අතුරෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා පත්කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා තිබියදී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාරවරිය වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ලෙස ඇගේ නිල තත්ත්වයෙන් ක්‍රියා කරමින්, මුල් අවස්ථා අධිකරණයන්හි සුදුසු ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධාරීන් සිටියදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් එසේ නොවන නිලධාරියෙකු වන මංජුල තිලකරත්න මහතා පත් කිරීමෙන් අධිකරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැරීමෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරිය වශයෙන් කටයුතු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති හෙයින් ද;

7. අංක 2/2012 සහ 3/2012 දරන ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව යටතේ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය යටතේ පවරන ලද පෙත්සමක පිටපතක් ඒ අවස්ථාවේදීම පාර්ලිමේන්තුවේ කථානායකවරයාට භාරදිය යුතු බවට සඳහන්ව තිබියදී, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට අධිකරණයේ ගොනු කරනු ලැබූ පෙත්සමක පිටපතක් භාරදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන සපුරා ඇති බවට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීන්දුවක් ප්‍රකාශයට පත්කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව නොසලකා හැර සහ / හෝ පටහැනිව ක්‍රියාකර ඇති හෙයින් ද;

8. අංක 5/91, 6/91, 7/91 සහ 13/91 දරන ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු වලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථ නිරූපණය කර ඇති ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාවේ සඳහන් අනිවාර්ය ක්‍රියාපටිපාටියට අනුකූලව ක්‍රියාකළ යුතු බවට තීරණය කර තිබුණ ද, ඉහත කී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක

වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් එකී ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති හෙයින් ද;

9. ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක වශයෙන් පත්කරන අවස්ථාවේදී ඇයගේ පත්වීම අභියෝගයට ලක්කරමින් පවරන ලද ජනාධිපති නීතිඥ එඩ්වඩ් ප්‍රැන්සිස් විලියම් සිල්වා සහ තවත් තිදෙනෙක් එදිරිව ශිරානි බණ්ඩාරනායක (1992 ශ්‍රී ලංකා නව නීති වාර්තා 92) මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද බහුතර තීරණය නොසලකා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ධූරයට පත්වීමෙන් පසු එකී තීන්දුවට පටහැනිව කටයුතු කර ඇති හෙයින් ද;

10. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක වීමට ප්‍රථම කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ කථිකාචාර්යවරියකව සිටියදී, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ ලිපියක් ප්‍රකාශයට පත්කර තිබූ Groundview නමැති මාධ්‍ය ප්‍රකාශන අංශය අයත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නමැති ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු පෙත්සම් අංක 02/2012 දරන පෙත්සම අසා තීරණයක් ලබා දී ඇති හෙයින් ද;

11. අග්‍ර විනිශ්චයකාර ධූරය දරනු ලබන සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිධූරය දරනු ලබන ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරධූරයකට පත්කිරීමේ යෝග්‍යතාව අභියෝගයට ලක්කරන ලද ජනාධිපති නීතිඥ එඩ්වඩ් ප්‍රැන්සිස් විලියම් සිල්වා සහ තවත් තිදෙනෙක් එදිරිව ශිරානි බණ්ඩාරනායක (1992 ශ්‍රී ලංකා නව නීති වාර්තා 92) නඩුවේදී එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ පත්වීමට එරෙහිව කුරුප්පුගේ බීටා ඇන් වර්ණසූරිය ස්වර්ණාධිපති මහෙස්ත්‍රාත්වරියගේ සහෝදරයා වූ නීතිඥ එල්. සී. එම්. ස්වර්ණාධිපති යන අය පෙත්සමක් ඉදිරිපත් කිරීම හේතුවෙන්, එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් එකී මහේස්ත්‍රාත් කුරුප්පුගේ බීටා ඇන් වර්ණසූරිය ස්වර්ණාධිපතිට හිරිහැර සිදුකර ඇති හෙයින්ද;

12. අග්‍ර විනිශ්චයකාරධූරය දරනු ලබන සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිධූරය දරනු ලබන ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව ප්‍රකාරව පැවරී ඇති ඇගේ ව්‍යවස්ථානුකූල බලය අභිබවා ක්‍රියාකරමින්, මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියට තමාගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවසරය ලබාගන්නා ලෙස නියම කිරීම මගින්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතා විසින් ඇයට සිදු කළ හිංසනය සම්බන්ධයෙන් පොලීසියට

පැමිණිල්ලක් කිරීම සඳහා රංගනී ගමගේ මහෙස්ත්‍රාත්වරියගේ නීතියේ පිහිට ලබාගැනීමේ අයිතියට බාධා එල්ලකර ඇති හෙයින් ද;

13. එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් අග්‍ර විනිශ්චයකාරවරිය වශයෙන් සහ ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ක්‍රියාකරමින්, තම බලය අනිසි ලෙස භාවිතා කරමින් මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියට පොලිස් ආරක්ෂාව ලබා ගැනීමට පෙරාතුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවසරය ලබාගන්නා ලෙස නියම කරමින් ඇයට පොලිස් ආරක්ෂාව ලබා ගැනීමට ඇති නීත්‍යානුකූල අයිතිය ක්‍රියාත්මක කිරීම වළක්වා ඇති හෙයින් ද;

14. තම නීත්‍යානුකූල අයිතිය ක්‍රියාත්මක කරමින් මහේස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මිය විසින් පොලිස්පතිවරයාගෙන් ආරක්ෂාව ඉල්ලා සිටීම පිළිබඳව විනය පරීක්ෂණයක් නොපැවැත්විය යුත්තේ ඇයිද යන්න පිළිබඳ එකී මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියගෙන් නිදහසට කරුණු විමසමින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ලෙස ක්‍රියා කරමින් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ලිපියක් යොමුකර ඇති හෙයින් ද;

ඉහත කී ආකාරයෙන් කටයුතු කිරීම මගින්,—

(i) අනිසි පැවැත්මක් හෝ අග්‍ර විනිශ්චයකාරධූරය දරන්නෙකුට නොගැලපෙන අන්දමේ පැවැත්මක් හෝ ස්ථාපිත වන බැවින්ද,

(ii) අධිකරණවල නඩු කාරණා විය හැකි කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න හෝ මතභේදයට ඉවහල් වන කරුණු සම්බන්ධයෙන් අදාළ වන සහ / හෝ විය හැකි කරුණු සම්බන්ධයෙන් කටයුතු කර ඇති බැවින්ද,

(iii) සාධාරණ යුක්තිය සලසාලීම කෙරෙහි බලපෑම් ඇති කර ඇති හෙයින්ද,

(iv) නඩු පාර්ශ්වයන් විසින් පක්ෂපාතීත්වය සහ / හෝ අපක්ෂපාතීත්වය පිළිබඳ චෝදනා එල්ල කිරීමට ඉඩ ඇති හේතු ඇතිවිය හැකි බැවින්ද,

මුළු මහත් ශ්‍රේෂ්ඨාධිකරණය සහ විශේෂයෙන්ම අග්‍ර විනිශ්චයකාර ධූරය අපකීර්තියට පත් කර ඇත්තේය.

එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂාකර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පුවී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත්කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(3) ව්‍යවස්ථාව සමග කියැවෙන 107(2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ, 78 අ දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ද ප්‍රකාරව යෝජනා කර සිටිමු.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1631/'11

1.

ගරු රාජීව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2461/'12

2.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අඬඩාලච්චේන 14, කොමන් පාරේ, අංක 4/5 දරන ස්ථානයේ පදිංචි එම්. ඒ. අබාජුල්ෆාන් මහතා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට 2006.06.01 දින පෙනී සිට ඇති බවත්;

(ii) සියලු සුදුසුකම් සපුරා සිටියත් ඉහත තනතුරට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මෙතෙක් ඔහුගේ නම නිර්දේශකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කාරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද (HRC/2775/09) නිර්දේශය ක්‍රියාවට නංවමින් (අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව) ඔහුට හිමිවිය යුතු උසස්වීම ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2864/'12

3\.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාවේ විශ්‍රාමික සහකාර වැද්දුම්කරු ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාගේ පැමිණිල්ලකට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කොළඹ මහ නගර සභාවට නිකුත් කළ නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් අංක LGD/09/01/10 හා 2012.02.29 දිනැති ලිපිය මගින් නාගරික කොමසාරිස් වෙතින් විමසා ඇති බවත්;

(ii) 2012.05.14 දින සහ 2012.05.31 දිනැති ලිපි මගින් තවදුරටත් ඒ පිළිබඳව සිහි කැඳවීම් කොට තිබෙන බවත්;

(iii) රා. ප. චක්‍රලේඛ අංක 17/2005 ට පටහැනිව ක්‍රියා කරන කොළඹ මහ නගරසභාවේ නිලධාරීන් ඉහත අ(i) හි සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහ්රූෆ් මහතාට නිර්දේශිත සහන ලබා දීම ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'11

4\.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2462/'12

5.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අකුරණ, දොඩම්ගොල්ලේ, අංක 233/1 දරන ලිපිනයේ පදිංචි, කුරුගොඩ මුහන්දිරම්ලාගෙදර නූර් මුහම්මද් සෙයියද් මුහම්මද් මහතා විසින් නුවරඑළිය මහ නගර සභාව සතු "කාර්ගිල්ස් පිටිය" වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමරයක් බද්දට ලබා ගැනීම සඳහා වර්ෂ 1993.01.04 දින රුපියල් ලක්ෂයක මුදලක් සහ 2002.09.25 දින රුපියල් අනූදහසක මුදලක් තැන්පත් කරනු ලැබුවත් මෙතෙක් ඒ මහතාට කඩ කාමරය ලබාදී නොමැති බවත්;

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනයකට අනුව සෙයියද් මුහම්මද් මහතාට අදාළ කඩ කාමරය හිමිවිය යුතු බවට ලබා දුන් නිර්දේශය (HRC/K/429/06/11) එම පළාත් පාලන ආයතනය විසින් පැහැර හරිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත නිර්දේශය ක්‍රියාවට නැංවීමෙන් වැළකී අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය උල්ලංඝනය කරමින් සිටින නුවරඑළිය මහ නගර සභාවේ වගකිව යුත්තන්ට එරෙහිව අපක්ෂපාති පරීක්ෂණයක් පැවැත්වීමටත්, සෙයියද් මුහම්මද් මහතාට සාධාරණය ඉෂ්ට කිරීමටත් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2865/'12

6.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරොව්පතාන පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටි උ.පො.කො. ඒ. එන්. එම්. තාහිර් මහතා (25878) අසනීප තත්ත්වය හේතුකොට ගෙන, පොලිස්පතිතුමාගේ අංක 190/2009 හා 2009.12.30 දිනැති චක්‍ර ලේඛය අනුව 2009.06.06 දින සිට විශ්‍රාම ගෙන සිටින බවත්;

(ii) 2006.02.24 දින සිට පොලිස් නිත්‍ය සේවයට පත්කොට තිබෙන මොහුගේ සේවය අන්තර්ග්‍රහණය කිරීමට අදාළ වන නිර්දේශය Staff/DIG/IG/Out/259/11 හා 2011.10.04 දිනැති ලිපියක් මගින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තාහිර් මහතා පොලිස් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කොට විශ්‍රාම දීමනා සහ අදාළ වැටුප් කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2866/’12

7.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කහටගහමඩ, සියඹලාගස්කොටුවේ පදිංචි එස්. එච්. එම්. පාතිමා මහත්මිය ගිරි/දලුපොතගම කණිෂ්ඨ විදුහලේ 2002.02.01 දින සිට ස්වේච්ඡා ගුරුවරියෙකු වශයෙන් සේවය කරමින් සිටින බවත්;

(ii) ඒ අනුව ගුරු සහායක පත්වීමක් ලැබීමට හිමිකම් ලද පාතිමා මහත්මියට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා අධ්‍යාපන අමාත්‍ය ලේකම් විසින් ව/ප්‍රඅලේ/ආ13/3/4 හා 2009.08.17 දිනැති ලිපිය මගින් එම පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට යොමු අංක 11 යටතේ කැඳවීම් කරනු ලැබුවත්, එම ගුරු සහායක පත්වීම මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 2009 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි පාතිමා මහත්මියට හිමි ගුරු සහායක පත්වීම ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2867/’12

8.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996.09.27 දින හෝ ආසන්න දිනයක අම්පාර දිස්ත්‍රික්කයේ, පාන්ඩිරුප්පු පොලිස් මාර්ග බාධකයේ රාජකාරියේ යෙදී සිටියදී, ත්‍රස්තවාදීන් විසින් පැහැර ගෙන ගොස් වෙඩි තබා ඝාතනය කරනු ලැබූ කල්මුනේ පොලිසියට අනුයුක්ත ග්‍රාමාරක්ෂක භට, අබ්දුල් රමීස් මහතා (9913) වෙනුවෙන් වන්දි මුදල් සහ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමක් මෙතෙක් සිදුවී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව කල්මුනේ පොලිසිය විසින්, අංක ඕඩබ්/3037/11 හා 2011.04.22 දිනැති ලිපිය මගින් සහ අම්පාර පොලිස් අධිකාරි විසින් අංක එස්ජ්2/ එච්ජී/10/2011 හා 2011.04.20 දිනැති ලිපිය මගින් ඉගිනියාගල සිවිල් ආරක්ෂක කාර්යාලය වෙත දැනුම් දී තිබුණත්, මේ දක්වාත් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඝාතනයට ලක්වූ අවිවාහක අබ්දුල් රමීස් මහතාගේ වයෝවෘද්ධ දෙමව්පියන් වන එම්. ඒ. අබ්දුල් අසීස් සහ යූ.එල්. ආසියා උම්මා යන අයවලුන්ට එම වන්දි මුදල් සහ ඔහුගේ විශ්‍රාම වැටුප් නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?